**කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය -2014**

**-------------------------------------------------------------------**

කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2014 ජූලි 01 සිට 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය අතර 2014 මාර්තු 28 දින එළඹී අංක එස්එල්-පීIII දරන ණය ගිවිසුමේ 1 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය මහා මාර්ග සහ නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ විශ්ව විද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහළ සංවලතා සම්බන්ධකයක් ලෙස කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය මගින් වාහන තදබදය අවම කිරීම හා විසුරුවා හැරීම මෙන්ම එමගින් කොළඹ නගරයේ ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම හා ආර්ථික සංවර්ධනය දිරිගැන්වීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 26,230 කට සමාන ජපන් යෙන් මිලියන 35,020 ක් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ජූලි 01 දින ආරම්භ කළ අතර 2023 ජූලි 01 අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි

හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත් පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා

පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

මාර්ග සංවර්ධන අධිකාරියේ ඇති ව්‍යාපෘතිය සමග ජංගම ගිණුමේ පෙන්වන ලද වටිනාකම රු. 15,633,480 ක ශේෂය, ව්‍යාපෘතියේ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ජංගම ගිණුමේ වටිනාකම රු. 16,593,299 ක ශේෂය සමඟ ගැලපී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

## 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය |
|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ජඅසනි | 35,020 | 26,230 | - | - |
| ශ්‍රී.ලං.ර | - | 8,558 | 1.6 | 1.6 |
| මාසංඅ ණය | - | - | - | 116.0 |
| එකතුව | 35,020 | 34,788 | 1.6 | 117.6 |

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ විදේශ සංරචකය යටතේ රු. මිලියන 100 ක් ඇතුළුව රු. මිලියන 359 ක මුළු වෙන්කිරීම්වලින් රු. මිලියන 357.4 ක් වෙනත් ව්‍යාපෘතියකට මහා භාණ්ඩාගාරය විසින් මාරු කර තිබුණි. කෙසේ වෙතත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය බැංකුවකින් ලබා ගත් ණය අරමුදල් භාවිතා කිරීමෙන් ව්‍යාපෘතිය, රු. මිලියන 116 ක ක්‍රියාකාරකම් සිදු කිරීමට වැය කර තිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ නිශ්චිත කාලපරිච්ඡේදය තුළදී කලින් හඳුනාගත් ඉලක්ක ආර්ථිකමය හා කාර්යක්ෂම අයුරින් සපුරාගැනීම තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘතිය ආරම්භයේදීම සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා සමස්ත ව්‍යාපෘති සැලැස්මක් හා සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. කෙසේ වෙතත් රේඛීය අමාත්‍යාංශයේ, මාර්ග සංවර්ධන අධිකාරියේ හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ක්‍රියාකාරකම්වල වගකීම පැහැදිලිව සමස්ත ව්‍යාපෘති සැලැස්මේ ඇතුළත් කර තිබුණද සමාලෝචිත කාල පරිච්චේදය තුළ ව්‍යාපෘති කටයුතු මෙහෙයවීම සඳහා විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ඉදිකිරීමේ වැඩ වලින් බලපෑමට ලක්වූ පවුල් නැවත පදිංචි කිරීමේ අරමුණ සඳහා සාලමුල්ල නිවාස සංකීර්ණයේ නිවාස 360 ක් මිලදී ගැනීම සඳහා විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව අත්තිකාරම් ලෙස ව්‍යාපෘතිය රු. මිලියන 100 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි.

(ඇ) පාලමේ ඉදිකිරීම් වැඩ වලින් බලපෑමට ලක්වූ රජයේ ආයතනවලට අයිති ගොඩනැගිලි 03 ක සැලසුම් හා යළි ඉදිකිරීම් සඳහා උපදේශන සේවාව රු. මිලියන 42.49 ක පිරිවැයකට දේශීය ආයතනයක් වෙත පවරා දී තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේවෙතත් එයින් එක් ගොඩනැගිල්ලක් සඳහා උපදේශන සේවා ඉවත් කරගෙන තිබුණු අතර එකග වූ මුල් පිරිවැයෙන් සියයට 10 ක් ඒ සඳහා අඩු කර තිබුණි. ගොඩනැගිලි 03 සඳහා උපදේශන සේවාවන් වෙන වෙනම හඳුනා ගැනීම ආරම්භක අවස්ථාවේදීම සිදු කර නොතිබීමේ හේතුවෙන් සංශෝධිත වැඩවල විෂය පථයට අදාල නිශ්චිත වටිනාකම හඳුනාගෙන අඩු කිරීමට නොහැකිවී තිබුණි.

## 3.3 මතභේදයට තුඩු දෙන කරුණු

---------------------------------

පාලම ඉදිකිරීමේ උපදේශන සේවාව සඳහා කැමැත්ත පළකිරීමට 2014 පෙබරවාරි 07 දින ජාත්‍යන්තර වශයෙන් කැඳවීම් සිදු කර තිබුණු අතර ඒ සඳහා ලංසු කරුවන් 05 ක් ප්‍රතිචාර දක්වා තිබුණි. කෙසේ වෙතත් ලංසු කරුවන් 04 ක්ම ඔවුන්ගේ මූල්‍ය හා තාක්ෂණික යෝජනා ඒ සමග ඉදිරිපත් කර නොතිබීම හේතු කොටගෙන තනි ලංසු කරුවෙකු සමඟ ඉදිරි කටයුතු කරගෙන යාමට ව්‍යාපෘතියට සිදුවී තිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2014 ජනවාරි 29 දිනැති ලිපිය මගින් තනතුරු 18 ක් සඳහා සාමාජිකයින් 33 ක් අනුමත කර තිබුණද 2014 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල සමාජිකයින් 33 කින් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සමන්විත විය. කෙසේ වෙතත් ප්‍රධාන ඉංජිනේරු තනතුරු 02 ක්, වැඩ බිම් ඉංජිනේරු/ තාක්ෂණික නිලධාරි තනතුරු 06 ක් සහ සහකාර ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරි තනතුරු 01 ක් පුරප්පාඩු වී තිබුණි.